

# බලශක්ති අර්බුදයට පිළියමක්

**ලෝක බලශක්ති පරිභෝජනය පිළිබඳ සලකා බැලීමේ දී, ජනතාවගේ විවිධාකාර වූ අවශ්‍යතාවන්ගෙන් වැඩි ප්‍රමාණයක් ඉටු කරනුයේ ඛනිජ තෙල්, ගෑස්, ගල් අඟුරු, සූර්යබලය, සුළං බලය වැනි නව බලශක්තීන් බව අවිවාදත්මක ය. එහෙත් අදින් වසර 150 කට පමණ පෙර, ප්‍රධාන බලශක්ති උත්පාදන මාර්ගය ලෙස "දර" ප්‍රමුඛ ස්ථානයක වැජඹිණි.**

ලෝක බලවතුන්ගේ බලශක්ති පරිභෝජනය කෙසේ වුවද, ශ්‍රී ලංකාව උදහරණ කොට විමසා බැලීමේ දී අදටත්, භාවිත බල ශක්ති-යෙන් සියයට 47 ක ප්‍රමාණයක් තිපදවනුයේ දර භාවිතයෙනි. (උදා : තේ කර්මාන්තය, පොල් කර්මාන්තය, ගඩොල් හා බේකරි කර්මාන්ත ආශ්‍රිතව)

ලංකාවේ සමස්ථ බලශක්ති නිෂ්පාදනයට, විදුලි බලය දයකත්වය සපයනුයේ සියයට 11 ක් තරම් සුලු පරිමාණයෙනි. එබැවින් ශ්‍රී ලංකාවේ මෙගා වොට් 200 ක විදුලිබල හිග-යක් නිර්මාණය වී ඇත. මෙම අර්බුදයට පිළි-යම් සෙවීමේ දී දර මගින් විදුලිය තිපදවීම ඉතා පහසු ක්‍රමයක් බව පෙනී යයි.

මෙහිදී ග්ලිරිසීඩියා දඬු මගින් ගැසිෆයර් යන්ත්‍ර හරහා විදුලිය ජනනය කළ හැකිය.

එම ක්‍රියාවලිය සරලව දැක්වුවහොත්,

ග්ලිරිසීඩියා දඬු අර්ධව දහනය කිරීමෙන් කාබන් මොනොක්සයිඩ් හා හයිඩ්‍රජන් යන ඉන්-ධන වායු තිපදවේ. මීට අමතරව වායුගෝලයේ පවතින කාබන් ඩයොක්සයිඩ් හා නයිට්‍රජන් ද වායු ද එයට මිශ්‍ර වේ. ඉන්පසු මෙම වායුන් තුළ අන්තර්ගත අනවශ්‍ය ද්‍රව්‍ය වන තාර හා කාබන් ඉවත් කර පිරිසිදු දහන වායුවක් ලෙස, ගෑස් දහන ජෙනරේටරයක් වෙතට යොමු කෙරෙන අතර එහි කාබියුලේටර් කොටසින් එන්ජිම තුළට ඇතුළු වී මෙම වායුන් ඉන්ධන ලෙසට දැවීම සිදු වේ. මෙහිදී ජෙනරේටරයේ ක්‍රියාකා-රිත්වය මත විදුලි බලය උත්පාදනය වේ.

**දර සහ ගල් අඟුරු, ඩීසල් "ශක්ති ජනනයේ දී" වැයවීම් සැසඳීම (ප්‍රමාණාත්මකව)**

දර (ග්ලිරිසීඩියා) කි.ග්‍රෑ. 4 = ඩීසල් කි.ග්‍රෑ. 1

දරු (ග්ලිරිසීඩියා) කි.ග්‍රෑ. 2 = ගල් අඟුරු කි.ග්‍රෑ. 1

ද්‍රව්‍යයන් ගේ මිල මත ඵලදායිතාව තීරණය කළ යුතුය.

ලංකා භූමියට අනුව, තිරසාර ආයෝජ-නයන්ට රාජ්‍ය අංශයේ මැදිහත් නොවීම මත "ග්ලිරිසීඩියා මගින් විදුලිය තිපදවීම" යන මාහැඟි කටයුත්ත අතපසු වන සෙයක් පෙනේ. එනමුදු පෞද්ගලික අංශයේ සූක්ෂ්ම ඇසට මෙය ලක්වෙමින් පවතී.

ත්‍රිකුණාමලයේ ටෝකියෝ සිමෙන්ති සමා-ගම, මෙම තාක්ෂණයෙන් ප්‍රයෝජන ලබන අතර පුත්තලම හොල්සිම් සිමෙන්ති සමාගම මෙගාවොට් පනහක ධාරිතාවෙන් යුතු බලාගා-රයක් ඉදි කිරීමට සැලසුම් කර ඇත. හැඳල ප්‍රදේශයේ අයිස් කර්මාන්තශාලාවක් තඩත්තු වන්නේද ගැසිෆයර් තාක්ෂණයෙනි.

නූතන ප්‍රවණතාව මත, කොළඹට විමධ්‍ය-ගතවී ඇති කර්මාන්ත, බලශක්ති අර්බුදය ප්‍රබල මෙන්ම ලංකාවට ආවේණික බලශක්තිය සොයා ගම් වදිනු ඇත. එවිට පාසල්, රෝහල්, දෙපාර්තමේන්තු, සංස්ථා සහ පරිපාලන ආය-තන රටපුරා ව්‍යාප්ත වනු ඇත.